නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing & Samurdhi

4 මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 வது மாடி செத்சிரிபாய பத்தரமுல்ல
4 floor, Sethsiripaya ,Battaramulla

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

මගේ අංකය / எனது இல / My No: DDD/HO/15/SW/03/01
ඔබේ අංකය / உமது இல / Your No: ..............................
දිනය / திகதி / Date: 2015.03.25

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,

**<u>වැඩි කරන ලද සමෘද්ධි සහනාධාර මුදල් ගෙවීම සහ සහන දිරිය ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ජාතික වැඩසටහන 2015.04.09.</u>**

2015 අතුරු අයවැය යෝජනා අනුව 200%න් වැඩි කරන ලද සමෘද්ධි සහනාධාර මුදල් සහ සහන දිරිය ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ජාතික උත්සවයට සමගාමීව දිවිනැගුම ප්‍රජාමූල බැංකු මට්ටමෙන් උත්සව පැවැත්වීමට ගරු අමාත්‍යතුමා විසින් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව මෙම උත්සවය ප්‍රාදේශීය දේශපාලන නායකයින්ගේ ද සහභාගීත්වයෙන් **2015.04.09 දින පෙ.ව. 09.30**ට පැවැත්වීමට කටයුතු කළ යුතුය.

02. ඒ අනුව සමෘද්ධි සහනාධාර මුදල් වැඩි කිරීම සංකේතවත් කිරීම සඳහා ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනට සහනාධාර ලබන ප්‍රතිලාභීන් තෝරා ගත යුතු වේ. සහනාධාරලාභීන් සියලුදෙනාගේ බැංකු ගිණුම්වලට වැඩි කරන ලද සහනාධාර මුදල බැර කර තිබිය යුතු අතර, අවශ්‍යවේනම් 2015.04.03, 04 හා 05 දිනයන්හිදී බැංකු විවෘත කර සියලුම ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට සහනාධාර මුදල් බැර කිරීම සිදු කළ යුතුය. එසේම උත්සව අවස්ථාවේදී අප්‍රේල් මසට අදාළව බැර කරන ලද මුදල් සටහන් කරන ලද බැංකු පොත් ප්‍රතිලාභීන්ට ප්‍රදානය කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් සැකසිය යුතුය.

03. එසේම සහන දිරිය ණය ප්‍රදානය කිරීම සංකේතවත් කිරීම සඳහා, තෝරා ගන්නා ලද සියලුම ප්‍රතිලාභීන් මෙම අවස්ථාවට සහභාගි කරවිය යුතුය. සහන දිරිය ණය වැඩසටහන යටතේ ප්‍රදානය කරන ලද ණය මුදල අදාළ ප්‍රතිලාභීන්ගේ බැංකු පොතේ සටහන් වී තිබිය යුතුය.

04. ප්‍රජාමූල බැංකු මට්ටමෙන් මෙම උත්සව සංවිධානය කිරීම සඳහා සුදුසු ස්ථාන තෝරා ගැනීමේදී වියදම ඉතා අවම වන පරිදි එම කාර්යය කළ යුතුය. හැකි සෑම අවස්ථාවකදීම පාසල්, ප්‍රජා ශාලා වැනි පොදු ස්ථාන වෙන් කරගන්නේනම් මැනවි.

05. මෙය ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

එච්.සුමනපාල,

අධ්‍යක්ෂ ජනරාල්.


| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| දුරකථන/ தொலைபேசி/Telephone: | 011-2872202 | 011-2861994 | 011-2873799 | 011-2889046 |
| ෆැක්ස්/ தொலைமடல்/Fax: | 011-2889002 | | 011-2873996 | |
| ඊ-මේල්/ மின்னஞ்சல்/E-Mail: | dgdivineguma@gmail.com | anuradhakum@yahoo.com | hrddivineguma@gmail.com | |